# දැන්වීමයි

## මැතිවරණ කොමිෂන් සභාව

### 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 7(4) (අ) වගන්තිය යටතේ දැන්වීම

01. 2009 අංක 58 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධිත) පනතෙන් සංශෝධිත 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ අංක 7(4) (අ) වගන්තිය අනුව මැතිවරණ කාර්යය සඳහා පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස සලකනු ලැබීම සඳහා වූ අයදුම්පත් 2022.01.24 දින සිට 2022.02.25 දින ප.ව.3.00 දක්වා භාරගනු ලැබේ. අදාළ අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අදාළ පක්ෂයේ ලේකම්වරයා පෞද්ගලිකව පැමිණ මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා වෙත භාරදීම හෝ කළ හැකිය. එම අයදුම්පත් යොමු කිරීමේ දී ලිපිකවරයේ ඉහළ වම්පස "දේශපාලන පක්ෂ පිළිගැනීම වෙනුවෙන් අයදුම් පත්‍රය-2022" යනුවෙන් සඳහන් කළ යුතු වේ. ලියාපදිංචි තැපෑලෙන් එවනු ලබන අයදුම්පත් "මැතිවරණ කොමසාරිස් ජනරාල්, මැතිවරණ කොමිෂන් සභාව, මැතිවරණ මහලේකම් කාර්යාලය, සරණ මාවත, රාජගිරිය (10107)" යන ලිපිනයට යොමු කළ යුතු වේ.

02. අයදුම්පත් භාරගන්නා අවසන් දිනයෙහි නියමිත වේලාවෙන් පසුව ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියාකරනු නොලැබේ.

03. දේශපාලන පක්ෂයක් ලෙස සලකනු ලැබීම සඳහා ඉල්ලුම් කරනු ලබන අයදුම්පත, පක්ෂයේ ලේකම්වරයා විසින් අත්සන් කරනු ලැබ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

04. අයදුම්පත්‍රය, මැතිවරණ කොමිෂන් සභාවේ නිලවෙබ් අඩවිය (www.elections.gov.lk) මඟින් බාගත කරගත හැකි අතර දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල මඟින් හා මැතිවරණ මහලේකම් කාර්යාලයෙන් ද අදාළ අයදුම්පත ලබාගත හැකි වේ.

05. පක්ෂය පිළිගනු ලැබුවහොත් එම පක්ෂය සඳහා වෙන් කරගනු ලැබීමට අපේක්ෂා කරනු ලබන්නේ අංක 2263/24 හා 2022.01.21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයේ සඳහන් අනුමත කරන ලද (ආ) උපලේඛනයේ සඳහන් ලකුණු අතුරින් කවර ලකුණක් ද යන්න එම ඉල්ලීමෙහි නිශ්චිතව සඳහන් කළ යුතු ය.

06. අයදුම්පත්‍රය සමග පහත සඳහන් ලේඛනවල සහතික කළ ඡායාපිටපත් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය. අවශ්‍ය වුවහොත් මුල්පිටපත් පරීක්ෂා කර බලනු ඇත.

    I. පක්ෂ ව්‍යවස්ථාව
    II. පක්ෂයේ නිලධාරි මණ්ඩලයේ ලැයිස්තුව (පක්ෂයේ නිලධාරි මණ්ඩලයට අවම වශයෙන් එක් කාන්තාවක් හෝ ඇතුළත් කිරීමට වගබලාගත යුතුය.)
    III. පක්ෂයේ විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශ (අයදුම්පත ඉදිරිපත් කරන දිනට ආසන්නතම වූ වසර හතරක)
    IV. පක්ෂයේ තත්කාලීන ප්‍රතිපත්ති ප්‍රකාශය
    V. දේශපාලන පක්ෂයක් වශයෙන් ආසන්නතම වූ වසර හතරකට වූ කාලය තුළ අඛණ්ඩව ක්‍රියාත්මක වූ බව සනාථ කිරීම සඳහා ඉදිරිපත් කළ හැකි සියලුම ලිපිලේඛන හා ඒ පිළිබඳ වාර්තාවක්

7. පිළිගත් දේශපාලන පක්ෂයක් ලෙස සලකනු ලැබීමට කෙරෙන ඉල්ලීමක් සම්බන්ධයෙන් 2009 අංක 58 දරන පාර්ලිමේන්තු මැතිවරණ (සංශෝධිත) පනතෙන් සංශෝධිත 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 7(5), (6) හා (7) යන නියමයන් තීරණාත්මක හා අවසානාත්මක වේ.

8. අංක 2263/23 හා 2022.01.21 දිනැති දේශපාලන පක්ෂ ලියාපදිංචිය සම්බන්ධ ගැසට් පත්‍රයේ සඳහන් නිර්ණායක අනුව කටයුතු කර ඇති බව සනාථ කළ යුතු වේ.

**මැතිවරණ කොමිෂන් සභාවේ නියමය පරිදි,**

**සමන් ශ්‍රී රත්නායක**
**මැතිවරණ කොමසාරිස් ජනරාල්,**
**මැතිවරණ කොමිෂන් සභාව.**

**මැතිවරණ කොමිෂන් සභාව,**
**මැතිවරණ මහලේකම් කාර්යාලය,**
**සරණ මාවත, රාජගිරිය. (10107)**
**2022 ජනවාරි මස 24 දින.**

සටහන - මෙ පිළිබඳව 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ විධිවිධාන පරිශීලනය කිරීම යෙහෙකි.

Kumarini Prathapasing
Assistant Commissioner of Elections
(Legal Investigation & Planning)
Election Commission
Sarana Mawatha,
Rajagiriya.

2022.01.21